# බහුභාර්යා සේවනය පිළිබඳ බෞද්ධ ආකල්පය

ආචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි[1]


භාරතීය සමාජය තුළ උසස් පහත් භේදයකින් තොරව බහුභාර්යා සේවනය විවිධ ස්ථරයන් නියෝජනය කරන පුද්ගලයින් විසින් විවිධ අරමුණු ඔස්සේ ක්‍රියාවට නගන ලද බව පිටක සාහිත්‍යය වෙත අවධානය යොමු කිරීමෙන් පෙනී යයි. මේ අතර ස්වකීය සමාජ තත්වය හා ආඪ්‍යත්වය නිරූපණය කිරීමේ ක්‍රමෝපායයක් ලෙස ඇතැම්හු බහුභාර්යා සේවනය සිදුකළ අතර, ඇතැමෙක් පරපුර පවත්වා ගැනීමේ අරමුණ පිට බහුභාර්යා සේවනයට යොමු වූයේ සිය පළමු භාර්යාවගෙන් සිය ප්‍රවේණිය පවත්වා ගැනීමට දරුවන් නොලැබුණු බැවිනි. මීට අමතරව සිය කාමුකත්වය නිසා ම පරස්ත්‍රී සේවනයෙහි නියැලීමත් ගණිකාවන් වෙත යාමත් දක්නට ලැබෙයි.

පතිබ්බතා, සතී, කුලිත්ථී, කුලපාලිකා, දාරො, ජායා, කලත්තා, සරණී, භරියා, පියා, පජාපතී, දුතියා, පාදපරිචාරිකා ආදී පදයන්ගෙන් බිරිද හැඳින්වුණු අතර අභිචාරිකා, වෙසි, ගණිකා, නගරසොභිනී, රූපූපජීවිනී, කුලටා, බන්ධකී ආදී පද බිරිඳගෙන් පිට කාම සේවනයට යොදාගත් අය හැඳීන්වීම සඳහා යොදා ගත් බව පෙනේ. යථෝක්ත අභිචාරිකා ආදීන් සිය ජීවිත පැවැත්ම සඳහා පර පුරුෂයන් සේවනය කළත් ජාරී අතිචාරිණී ආදී නම් වලින් හැඳින්වෙන ස්ත්‍රීහු වින්දනය උදෙසා ම පරපුරුෂයන් වෙත පැමිණියාහුය. එසේ ම සැහැසි ලෙස මෙන් ම ප්‍රිය බවට පත් කරගෙන පරස්ත්‍රීන් ආශ්‍රය කිරීම ද දක්නට ලැබෙන්නකි.

මේ අතර සමාන භාර්යාවන් හෝ ප්‍රධාන බිරිඳට අමතරව වෙනත් බිරින්දෑවරුන් ප්‍රසිද්ධියේ පවත්වාගෙන යාම හෙවත් බහුභාර්යා සේවනය පිළිබඳ පිටකාගත කරුණු අධ්‍යයනය කිරීම අප පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ වෙයි. එසේ ම බිරින්දෑවරුන් විශාල පිරිසක් හෝ කිහිප දෙනෙක් පවත්වාගෙන යාම හා ඒ පිළිබද බුදුරදුන්ගේ අදහස විමසීමට ලක් කිරීම ද මෙම පර්යේෂණයෙන් අරමුණකි.

බහුභාර්යා සේවනය භාරතීය සමාජයේ ස්ථාපිතව පැවැතිය ද බුදුරදුන්ගේ වඩාත් ඇගයුමට පාත්‍ර වන්නේ එක් බිරිදක් වෙත පමණක් විසීම බව ද මෙහිලා පර්යේෂණ නිගමනය ලෙස ඉදිරිපත් කළ හැකිය.


**ප්‍රමුඛ පද :** බහුභාර්යා සේවනය, පරපුරුෂයන්, සමාන භාර්යාවන්, ප්‍රවේණිය

1 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය